# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,564—1965 නොවැම්බර් 22 වැනි සඳුදා—1965.11.22

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

1965 අංක 437

අ. ආ. කා. අංකය : සී. 162/49 (5)

කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, බී. මහාදේව මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥවල 51 වැනි වගන්තිය යටතේ, ගොවිජන සේවා කොමසාරිස්, ලංකා පරිපාලන සේවයේ ජේ. වී. ෆොන්සේකා මහතා තම රාජකාරිවලට අමතරව, 1965 නොවැම්බර් 17 වැනි දින සිට කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් වැඩ බැලීමට පත් කළ බව මෙයින් දැනුම දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1965 නොවැම්බර් 17 වැනිදින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.
11–914

---

## ආණ්ඩුවේ නිවේදන

### විනිමය පාලන පනත

(අංක 423 දරන අධිකාරය වන) විනිමය පාලන පනතේ 22 වන වගන්තියෙහි (3) හා (4) දරන උප වගන්ති මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝගය.

ඩු. පි. වන්නිනායක,
මුදල් ඇමති.

1965 නොවැම්බර් 20 වැනි දින,
කොළඹ දී ය.

### නියෝගය

(අංක 423 දරන අධිකාරය වන) විනිමය පාලක පනතේ 22 වන වගන්තියෙහි (3) හා (4) දරන උප වගන්ති යටතේ පනවනු ලැබ 1962 සැප්තැම්බර් 21 වන දින අංක 13,312 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ නියෝගය, එහි උපලේඛනයෙහි 1 වන කොටසෙහි සම්පූර්ණ පාඨය වෙනුවට පහත සඳහන් පාඨය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

එක්සත් රාජධානිය, චැනල් දූපත් හා අයිල් ඔෆ් මෑන්.
ඕස්ට්‍රේලියානු පොදුරාජ්‍ය මණ්ඩලය.
බුරුමය.
සයිප්‍රස් සමූහාණ්ඩුව.
ඝානාව.
ගැම්බියාව.
අයිස්ලන්තය.
ඉන්දියාව (සිකිම් ඇතුළුව).
අයර්ලන්ත සමූහාණ්ඩුව.
ජැමෙයිකාව.
ජෝර්දාන හෂෙමයිට් රාජධානිය.
කෙන්යාව
කුවායිට් රාජ්‍යය.
ලිබියා එක්සත් රාජධානිය.
මලාවිය.
මැලේසියා ෆෙඩරල් රාජ්‍යය.
මෝල්ටාව.

නවසීලන්තය.
නයිජීරියාව.
පකිස්ථානය.
සීරාලියෝනය.
සිංගප්පූරුව.
දකුණු අප්‍රිකානු සමූහාණ්ඩුව සහ නිරිතදිග අප්‍රිකානු රාෂ්ට්‍රය.
ටැංගනිකා එක්සත් සමූහාණ්ඩුව.
ට්‍රිනිඩෑඩය සහ ටොබාගෝව.
උගන්ඩාව.
බටහිර සැමෝආව.
සැම්බියාව.

ඉහත දැක්වෙන ඡේදවල සඳහන් නොවුනු, කැනඩාව හා රොඩීසියාව හැර, මහා රාජිනියගේ ඩොමිනියන් රාජ්‍යවල කවර හෝ කොටසක්.

1948 හා 1958 වර්ෂවල බ්‍රිතාන්‍ය ජාතිකත්ව පනත්වල අර්ථය ඇතුළත වූ කවර හෝ ආරක්ෂිත ප්‍රදේශයක්, ආරක්ෂිත රාජ්‍යයක් හෝ භාරකාර රාෂ්ට්‍රයක්.

11–1074

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## අංක 26/65 දරන ආනයන පාලන දැන්වීම

### 1965 එක්සත් රාජධානි/ලංකා ණය යටතේ බලපත්‍ර

1965 එක්සත් රාජධානි/ලංකා ණය යටතේ එක්සත් රාජධානියෙන් පෝර, වෙළඳ කටයුතු සඳහා වාහන සහ අමතර කොටස්, ඉංජිනේරු බඩු බාහිර, ගොඩනැගිලි ද්‍රව්‍ය, කාර්මික අමු ද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ ආනයන කිරීම සඳහා විශේෂ බලපත්‍ර නිකුත් කිරීමට යෝජනා කර ඇත.

2. 1965 එක්සත් රාජධානි/ලංකා ණය යටතේ සියලුම ආනයනයන් ණයවර ලිපි එල්ලේ කෙරෙනු ලැබේ.

3. මෙම ක්‍රමය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් පහත සඳහන් කාර්ය පරිපාටිය අදාල වන අතර දැනට පවතින කාර්ය පරිපාටියට අනුපූරක වනු ලැබේ :—

(i) ''1965 එක්සත් රාජධානි/ලංකා ණය'' කියා ශීර්ෂගත කරනු ලබන විශේෂ පංගු වෙන් කිරීමක් හෝ බලය දීමක් ලැබීමෙන් පසු, ආනයනකයා ඔහුගේ එක්සත් රාජධානියේ සැපයුම්කරු සමග ගණුදෙනු විවෘත්ත කිරීමෙන් හා කොන්ත්‍රාත්තුවක් සම්පූර්ණ කිරීමෙන් පසු ආනයන පාලන දෙපාර්තමේන්තුවේ පංගු අංක යොමුව සඳහන් කර (ඉංග්‍රිසි අනුවාදයේ පරිශිෂ්ඨයෙහි දක්වා ඇති පිළිවෙලට) කොන්ත්‍රාත්තුවේ හා කොන්ත්‍රාත් සහතිකයේ පිටපත් 3ක් එංගලන්තය, එස්. ඩබ්ලිව්. 1, ලන්ඩන්, මිල්බෑන්ක්, 4 හි පිටරට ආණ්ඩු හා පාලනයන් සඳහා වූ ක්‍රවුන් ඒජන්තවරු වෙත වහාම ඉදිරිපත් කරන ලෙස ඔහුගේ සැපයුම්කරුට උපදෙස් දෙනු ඇත.

(ii) ලිපි ලේඛන පරීක්ෂා කිරීමෙන් පසු කොන්ත්‍රාත්තුව හා කොන්ත්‍රාත් සහතිකය අනුමත කිරීම කොළඹ, ආනයන හා අපනයන පාලකට ක්‍රවුන් ඒජන්තවරු දැනුම් දෙනවා ඇත. මෙම අනුමත කිරීම ඔහු ආනයනකයාට දන්වන අතර, ආනයනකයා බලපත්‍ර ලබා ගැනීම සඳහා ඔහුගේ එක්සත් රාජධානියේ සැපයුම්කරු සමග ඇතිකරගත් කොන්ත්‍රාත්තුව අනුව (අංක 19/62 දරණ ආනයන පාලන දැන්වීමේ දක්වා ඇති ක්‍රමයට) පිටපත් හතරකින් යුක්තව ඉන්ඩෙන්ට් පත්‍රය ඉදිරිපත් කරනවා ඇත.

(iii) බලපත්‍රය ලබා ගැනීමෙන් පසු ඔහුගේ එක්සත් රාජධානියේ සැපයුම්කරු වෙනුවෙන් අවලංගු නොවන ණයවර ලිපියක් විවෘත කරන ලෙස ආනයනකයා ඔහුගේ බැංකුවෙන් ඉල්ලා සිටිනවා ඇත.

(iv) එක්සත් රාජධානියේ සැපයුම්කරු ලංකාවේ ආනයනකයාට බඩු නැව්ගත කර ණයවර ලිපියෙන් අවශ්‍යවූ ලිපි ලේඛන එක්සත් රාජධානියේ අදල බැංකුවට ඉදිරිපත් කරනවා ඇත. බැංකුව ගෙවීම කර ස්ටර්ලින් වලින් වැය මුදල් ආපසු ගෙවීම සඳහා ඉන්වොයිසිය හා ගෙවීමේ සහතික ක්‍රවුන් ඒජන්තවරුන් වෙත ඉදිරිපත් කරනවා ඇත. මෙයින් අනතුරුව මුල් ලිපි ලේඛන ආනයනකයාගේ ලංකාවේ බැංකුවට ඉදිරිපත් කරනවා ඇත.

(v) ඉන්පසු ඉවත්කර ගැනීම සිදුවන්නේ සාමාන්‍ය කාර්ය පරිපාටියට අනුකූලවයි. නමුත් ප්‍රකාශන ආකෘති වල ඉහළ වම් කෙළවරේ ලොකු අකුරින් '' 1965 එක්සත් රාජධානි ලංකා ණය '' කියා සළකුණු කරනු ලැබේ.

4. සටහන් කරගත යුතුයි—

(i) මෙම වැඩ පිළිවෙල යටතේ කෙරෙන ආනයනයන් එක්සත් රාජධානියේ සම්පූර්ණයෙන්ම නිපදවන ලද හෝ සාදන ලද බඩුවලට සීමා කරනු ලබන අතර කොන්ත්‍රාත්තුව යටතේ අර්ථලාභියා (චැනල් දූපත් හා අයිල් ඔෆ් මෑන් දූපත ඇතුළුව) එක්සත් රාජධානියේ වෙළඳාම කරගෙන යන පුද්ගලයෙක් විය යුතුයි ;

(ii) ගනුදෙනු මි. ර. ඇ. පදනම මත වන අවස්ථාවලදී, මුළු මුදල ණය යටතට ගැනෙනවා ඇත. නැ. ගා. නො. කොන්ත්‍රාත්තුවලදී නැව්ගත කිරීමට පිළියෙල කිරීම බ්‍රිතාන්‍ය වෙළඳ සමාගමක් සමග කළ යුතු අතර රක්ෂණයද, ලංකා රක්ෂණ සංස්ථාව සමග නොකෙරේන්නේ නම්, බ්‍රිතාන්‍ය සමාගමක් සමග පිළියෙල කරගත යුතුයි.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
ආනයන හා අපනයන පාලක.

1965 නොවැම්බර් මස 22 දින,
කොළඹ දී ය.

11–1123

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි